# ජය මංගලම් ! සුභ මංගලම් !

**කෞෂල්‍යා වොන්හාට්**
-ශ්ලේන් වේවලි-

ඔබගේ ජීවිතයේ වැදගත් දින මොනවාද? මංගල දිනය එයින් එක් දිනයක් නොවන්නේද? මංගල දිනයේ සෑම අංගයක්ම ප්‍රකාශ කරන්නේ "එකමුතු බව" නැතිනම් එකට බැඳීමයි. යුග දිවියකදී පිරිමියෙක් සහ ගැහැණියක් එකව ජීවත් විය යුතුයි. කුඩා දරුවන් පිරිවරා සිටීම මංගල දිනයේ සංකේතවත් කරන්නේ කුමක්ද? නව යුවලට අනාගතයේ දරු සම්පත්තිය ලැබීම මෙහි සංකේතවත් වේ.

මීට අමතරව මංගල දිනයේ අත්‍යාවශ්‍ය අංග සහ එහි අරුත් හඳුනා ගැනීම යුග දිවියට එළඹෙන ඔබට උපකාරී වේ.

**මංගල මුද්ද**

මංගල මුද්ද සෑම මුද්දකටම වඩා වෙනස්ය. එහි පටන් ගැනීමක් හෝ අවසානයක් දැකීමට නැත. මංගල මුද්දෙන් ප්‍රකාශ කරන අරුත් ද සුලභය. එකමුතු බව හා පූර්ණත්වය මේ අතරින් ප්‍රධානත්වයක් දරයි. පූර්ණවත් යුග දිවියක් සහ අනන්ත භාවයක් ද විදහා පෑමට මෙම විශේෂ මුද්ද උපකාරී වේ. මංගල මුද්ද විවිධ රටවල සහ විවිධ සංස්කෘතිවල විවිධ ඇඟිලිවල පළඳී.

**මධු සමය**

මංගල දිනය සහ මධු සමය යන සිදුවීම් එකිනෙකට බැඳී ඇත. මධු සමය යනු පුරාණයේ සිට පැවත එන චාරිත්‍රයකි. "මධු" යන්නෙන් මෙහි ප්‍රකාශ වෙන්නේ පැණි වලින් :යදබැහ* සකසා ගත් වයින් වර්ගයකි. මෙම වයින් වර්ගය මංගල දිනයෙන් පසු මාසයක් පානය කරන බව පැරණි මතයයි. පැරණි ක්‍රමය යනු මාසයක් ලෙස සැළකෙන්නේ 'සඳ' දැකීමට ලැබීමයි. සඳ දැකීමට ලැබෙන්නේ මසකට වරකි. ණීයදබැහ පදදබ෴ නැතිනම් 'මධු' සමය ආරම්භ වී ඇත්තේ මේ ආකාරයටය.

**වේලය**

මනාලියන් වේල් එක පැළඳීම අතීතයේ පමණක් නොව වර්තමානයේද සුලභ දසුනකි. සෑම කෙනෙකුම නොඉවසිලිව සිටින්නේ මනාලියගේ පෙම්බර වත දැක ගැනීමටයි. නමුත් වේල් එක ඉවත් කරන්නේ චාරිත්‍රානුකූලවයි. වේල් එක පළඳින්නේ අලංකාරයටම පමණක්ද? පැරණි මතයට අනුව වේල එක පළඳින්නේ මනාලිය බාහිර බලවේග නැතිනම් යක්ෂ බැල්ම වැනිදේ වලින් ආරක්ෂා කිරීමයි. සමහර මානලියන් යෙහෙළියකගේ වේල් එකක් පැළඳීමට ප්‍රිය කරයි. නමුත් මෙම යෙහෙළිය සාර්ථක යුග දිවියක් ගතකර ඇතිනම් පමණයි.

**මනාලියගේ මල් කළඹ / බොකේ**

මල් ගැන කතා කරන විට ඵලදායකත්වය සහ අනුරාගී බව ද නිතර මතකයට නැගේ. මංගල මල් කළඹ සංකේතවත් කරන්නේ ප්‍රීතිය සහ සෞභාගයයි. මල් කළඹ වටේට රිබන් වලින් අලංකාර කරන්නේ "සුභ" ලකුණකි යන්නය. රිබන් අග නොට්ස් :ණබදවී* නැතිනම් ගැට දැකගත හැකිය. මෙය එකමුතු බවේ සංකේතයකි. මනාලිය මල් කළඹ විසි කිරීම මෑත කාලයේ ආරම්භ කළ සිරිතකි. එය අල්ලා ගැනීමට යෞවනියන් ආශාවෙන් බලා සිටී. එහි සැඟවුන අරුත නම් මල් පොකුර අල්ලා ගත් යෞවනිය ඊළඟට මනාලියක් වන බවයි.

**වෙඩින් කේක්**

වෙඩින් කේක් මංගල උත්සවයකදී ඉතාමත් අත්‍යවශ්‍ය අංගයකි. වෙඩින් කේක් වලින් ප්‍රකාශවත් කරන අරුත් එමටයි. මංගල දිනයේ පිළියෙල කරන කේක් අනික් සෑම කේක්වලට වඩා වෙනස්ය. මංගල කේක් සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය ඉතා අනර්ඝ සහ උසස් තත්වයේ ද්‍රව්‍යයන්ය. ඉතා අනර්ඝ තත්වයේ අමුද්‍රව්‍ය විදහා පාන්නේ ප්‍රීතිමත් බව සහ උසස් තත්වයයි. තවදුරටත් මංගල උත්සවයට පැමිණි ආරාධිතයන්ටද වාසනාව සහ සෞභාග්‍යය "වෙඩින් කේක්" ගෙනදෙන බව විශ්වාස කෙරේ.

මනාලිය කේක් කැපීම සංකේතවත් කරන්නේ යුගදිවියේ සෞභාගයයි. තවදුරටත් මනාලිය සහ මනාලයා එක්ව වෙඩින් කේක් කැපීම සංකේතවත් කරන්නේ යුග දිවියේ සෞභාග්‍ය දෙදෙනාම එක්ව භුක්ති විඳීමයි.

**මංගල ඇඳුම**

මනාලියගේ ඇඳුම නැතිනම් මංගල සාරිය හෝ ගවුම තරම් කැපී පෙනෙන දෙයක් මංගල උත්සවයක ඇත්ද? සෑම කෙනෙක්ම පුන පුනා බලා සිටින්නේ අළුත් මනාලිය දැක ගැනීමටය. සෑම යෞවනියක්ම මංගල දිනයේ ඉතා අලංකාර ලෙස සැරසීමට ආශා කරයි. මනාලියගේ මංගල ඇඳුමට ඉතා දීර්ඝ ඉතිහාසයක් ඇත. එය පුරාණ ඊජිප්තු යුගයට විහිදේ. ඉතිහාසයේ මනාලියගේ මංගල වස්ත්‍රය ඉතා සිනිදු සිල්ක් වලින් සාදා නිම කරන ලදී. කාලයත් සමඟ එය වැඩි දියුණු වී මංගල ඇඳුම විවිධ ආකාරයෙන් වර්තමානයේ නිම කරගනු ලැබේ.



වික්ටෝරියා රැජින මංගල ඇඳුමට නව ජීවනතයක් ගෙන දුන් අතර එය ඓතිහාසික පරිවර්තනයකි. පළමු වරට මංගල ඇඳුම 'සුදු' වර්ණයෙන් නිමකර පැළඳීමට ඇය මූලික අඩිතාලම තබන ලදී. වික්ටෝරියා රැජිනට පසු මනාලියිනි 'සුදු' මංගල වස්ත්‍රය ප්‍රිය කිරීමට ආරම්භ කළේය. 'සුදු' වර්ණය පාරිසුද්ධ බවේ සංකේතයයි. තවදුරට ද 'අහිංසක්තවය' විදහා පෑමට සුදු උපකාරී වේ.

පැරණි මතයට අනුව මංගල වස්ත්‍රය සෑදිය යුත්තේ අන් අයෙකු විසින්ය. මනාලිය විසින් තම මංගල වස්ත්‍රය සාදා නිමකර ඇතිනම් එය අසුභ ලකුණකි. එලෙසම මංගල දිනයට පෙර තම මංගල වස්ත්‍රය පැළඳීම ද අසුභ ලකුණක් ලෙස සැළකේ. මනාලිය මංගල ඇඳුමින් සැරසී කණ්ණාඩිය ඉදිරියේ තමන් දෙස බැලීම ද සුභ ලකුණක් නොවන බව පැරණි මතයයි.

**සහල් යොදා ගැනීම**

සහල් මනුෂ්‍ය වර්ගයාට අත්‍යවශ්‍ය ද්‍රව්‍යයකි. බාහිර ආසියාතික පමණක් නොව අප්‍රිකානු රටවල ද පවා සහල් ආහාරයට ගනී. සහල් වලින් ප්‍රකාශවන අරුත් ද එමටය. ශක්තිමත් බව, සෞභාග්‍ය සහ ඵලදායි 'සහල්' සංකේතවත් කරයි. එමනිසා එදිනෙදා පරිභෝජනයට පමණක් නොව මංගල උත්සව චාරිත්‍රවලට ද සහල් යොදා ගැනීම පුදුමයක් නොවේ. චීන චාරිත්‍රවලට අනුව 'රජකපුද' භාවිතා කරනු ලැබේ. රටකපු යනු 'හුවා ශන්' ය. 'හුවා ශන්' යන්නේ අර්ථවත් කරන්නේ, 'දරුඵලදාවයි'

**රන් ආභරණ**

මනාලියන් "පරණ" දෙයක් භාවිතා කිරීම හෝ පැළඳීම මංගල දිනයේ සුළභ දසුනකි. පැරණි දෙයක් අර්ථවත් කරනේ "සාර්ථක" යුගදිවියක් ගත කළ වැඩිමහල් කාන්තාවකි. මෙහිදී මෙම වැඩිමහල් කාන්තාවගේ ස්වාමි පුරුෂයා ජීවතුන් අතර සිටීම ඉතා වැදගත්ය. එකලම සාර්ථක යුග දිවියක් ගත කළ කාන්තාවකගේ අත්දැකීම් ඉදිරි පරපුරට අනර්ඝ අවවාදයක් සහ ආශිර්වාදයක් වේ.

රන් ආභරණ වලින් තොර මංගල්‍යයක් ගැන කතා කළ හැකිද? 'රන්' සංකේතවත් කරන්නේ 'සූර්යයාය' රන් පැළඳීම සූර්යයා සමලා සබඳකම හුවාපෑම සෑම ජීවිතයකටම ආලෝකය ගෙන දෙන්නේ සූර්යයා. එමනිසා රන් ආභරණ මංගල දින වැදගත් තැන්ක උසුලන බව නිසැකය.

මෙහි සඳහන් කර ඇත්තේ මංගල උත්සවයකදී අත්‍යවශය අංගයන් කිහිපයකි. මෙයට අමතරව වෙනත් දේවල්ද මංගල උත්සවයකදී වැදගත් වේ. වෙනත් දේවල්ද මංගල උත්සවයකදී වැදගත් වේ. මෙම සියළු අංගයන් දම්වැලක පුරුකක් ලෙස බැඳී ඇති අයුරු ඔබට පැහැදිලිව තහවුරු වන බව නොඅනුමානය.


2015 ට අලුත්ම ෆෙංෂුයි රහස් ආසිරි වනිගරත්න වැඩමුළුව

ලංකාවේ නගර 22 ක සහ ඔස්ට්‍රේලියාවේ මෙල්බන් නගරයේදී

2015 සෑම නිවසකටම එන ෆෙංෂුයි යෝග

1. MONEY STAR අධික ධන වාසනාව
2. SECONDARY MONEY STAR දෙවැනි ධන යෝගය
3. MISFORTUNE STAR අවාසනාවන්ත යෝගය
4. SICKNESS STAR අසනීප යෝගය
5. ARGUMENT STAR ගැටුම් ඇතිකරන දිශාව
6. ACADEMIC STAR අධ්‍යාපන යෝගය
7. ROMANCE STAR ආදරය/ආලයට බලපාන දිශාව
8. HEAVEN STAR දිව්‍යලෝක වාසනාව
9. ROBBERY STAR සොරකම් සහ ගැටුම් යෝගය

මෙම ශුභ යෝගවලින් ප්‍රයෝජන ගන්නා ආකාරයත්, අශුභ යෝග පාලනය කරගන්නා ආකාරයත් මෙම වැඩමුළුවේදී උගන්වනවා.

2015 වසර අයත් වන්නේ බැටළුවා චීන ලග්නයටයි. බැටළුවාගේ වසර තුළදී එනම් 2015 පෙබරවාරි 19 සිට 2016 පෙබරවාරි 7 දක්වා ඔබේ සහ ඔබේ නිවසේ වාසනාව දෙගුණ තෙගුණ කරගන්නා ආකාරය මේ වැඩමුළුවේදී උගන්වනවා.

2006 වසරේදී මුල්වරට පැවැත්වූ මෙම වැඩමුළුව සෑම වසරකම පැවැත්වූවා. මෙවර පවත්වන්නේ 10 වෙනි වසරයි.

මේක ජාත්‍යන්තර වැඩමුළුවක්

මේ වැඩමුළුව ලොව සෑම දියුණු රටකම ජනවාරි, පෙබරවාරි මාසවල පැවැත්වෙනවා. ඔස්ට්‍රේලියාවේ ඉන්න ෆෙංෂුයි උපදේශකවරු විසිනුත් මෙහි වැඩමුළු පවත්වනවා. ටිකට්පතක මිල ඩොලර් 85 - 120 අතර වෙනවා. ඒත් අපි අයකරන්නේ ඩොලර් 25 ක් පමණයි. ලංකාවේ නම් රු. 600/= පමණයි.

අපේ ගෙදරට කරන රහස්

2015 වසරේදී අපේ ගෙදරට කරන අලුත් ෆෙංෂුයි රහස් සියල්ල මම ඔබට හෙළිකරනවා. (කියලා දෙනවා). මොකද අවුරුදු පතා නිවසේ වාසනාව ටිකක් වෙනස් වෙනවානේ. ඒවා කලින් දැනගෙන ඒ අනුව අලුත් ෆෙංෂුයි රහස් යොදාගෙන අපේ වාසනාව කිහිප ගුණයකින් වැඩි කරගන්න පුළුවන්.

ඔබේ පැතුමක් ඉටුකරන ෆෙංෂුයි ප්‍රාර්ථනා පත්‍රය
(ඔබේ ලොකුම බලාපොරොත්තුව 2015 දී ඉටුකර ගන්න)




මුල්වරට මෙම බලසම්පන්න ප්‍රාර්ථනා පත්‍රය මා ලබාදුන්නේ 2009 වැඩමුළුවේදී. ඔබේ යම්කිසි ප්‍රාර්ථනාවක් මේ ගුප්ත මන්තර කොළයේ ලියලා සූර්යයා දෙස බලාගෙන එම කොළය නවලා මෙය සඟවා තබාගත යුතුයි. ඒ සියල්ල මම වැඩමුළුවේදී උගන්වනවා. මෙම ක්‍රමය කොයිතරම් සාර්ථකද කියනවා නම් අපේ සෑම වැඩමුළුවකදීම අපි මේ ගුප්ත පත්‍රිකාව නොමිලේ දෙනවා. මෙහි වටිනාකම මිල කරන්න බැහැ. ඒත් ඔබට නොමිලේ!

ගැඹුරු චීන ජ්‍යොතිෂයෙන් ඔබට 2015 පලාඵල



ඔබේ උපන් වෙලාව ලියාගෙන එන්න. මම ඔබට ඒ අනුව විනාඩි 10 න් චීන ක්‍රමයට කෙටි කේන්දරයක් හදාගන්නා ආකාරය උගන්වනවා. ඊටපසුව ඔබේ කේන්දරයට 2015 ඔබට පලාඵල විස්තරය මම දෙනවා. මේ පාඩම් මාලාව ගිය වසරේ වැඩමුළුවේ ජනප්‍රියම අංගය වුණා.

මෙල්බන් - වැඩමුළුව

පෙබරවාරි මාසේ දෙවන සතියේදී මෙල්බන් නගරයේදී පැවැත්වෙනවා. උදේ 8.45 දවල් 1.00 දක්වා. අයකිරීම ඩොලර් 25 ක් පමණයි.

මෙල්බන් වැඩමුළුවට සහභාගි වීමට කැමති අය කලින්ම ඒ බව දැනුම් දිය යුතුයි. S.M.S පණිවිඩයකින් හෝ ඊ-මේල් එකකින් අදම දන්වන්න. (ආසන සීමිතයි)

DINESH - 044-9281003
asirimelb@gmail.com

Web - www.fengshuilanka.com
Face book - asiriwanigaratne.fengshuicollection